# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/5 - 2015 මාර්තු මස 23 වැනි සඳුදා - 2015.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**මොරටුව මහ නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන මොරටුව මහ නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

යොන් මෙරෙඤ්ඤගේ චමින්ද කුමාර සිල්වා නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ මොරටුව මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන අතුල කර්නල් පීරිස් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මොරටුව මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අතුල කර්නල් පීරිස් මහතා මොරටුව මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම් භාර නිලධාරී,
මොරටුව මහ නගර සභාව.

2015 මාර්තු මස 23 වන දින,
නාගරික මැතිවරණ කාර්යාලය,
කොළඹ.

04 - 224


1A - G 21253— 17 (2015/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*